18 AUG 2011

‘ දෙවියකු කී දෙයක් වත්

කරුණු නැති වැ නො අදහනු ’

— විරිත් වැකිය: පිවිසුම

# රෝහණ

# RŌHAṆA

No. 1 : 1985

AP-6494

Printed at
The University Press
Moratuwa
Sri Lanka

*Editorial Board:* V. VITHARANA, Editor-in-Chief
S. K. CHARLES
ANOJA I. FERNANDO
M. A. PREMADASA
SIRIMAL RANAWELLA

*Enquiries:* **The Librarian,**
University of Ruhuna,
Matara, Sri Lanka.

**Price: Rs. 25/- £ 1.00 $ 1.50**

(Remittances should be sent in favour of the University of Ruhuna)

# අප ගැන . . . .

ඓතිහාසික රෝහණ හෙවත් රුහුණු දනව්ව කළු සහ මහවැලි යන ගංගාවලට දකුණින් ශ්‍රී ලංකා දිවයිනේ අඩක් පමණ භූමි භාගයක් වසා පැවැත්තේ ය. නිරිත දිග වෙරළකරෙහි සිට ඊශාන වෙරළ තෙක් විවිධ ස්වාභාවික ප්‍රදේශ වසා එය පැතිරුණෙන් බටහිරින් මුහුදට නෙරා ගිය තුඩුවක් ද, මධ්‍යම කඳුකරයේ උස් පර්වත ශිඛරයක් ද, නැගෙනහිර මුහුදු තීරයේ කලපුවක් ද එක සේ රුහුණට ම අයිති විය. එහෙත් කාලයා ගේ ඇවෑමෙන් මෙම පදය ස්වරූපයෙන් වෙනස් නුවුව ද, අරුතින් පෙරළියකට පත් වුණු නිසා අද 'රුහුණ' යන්නෙන් දැක්වෙන්නේ ඒ පුළුල් ව පැතිරුණු ඉමහත් භූමිභාගය නොව, දකුණු වෙරළ හා තදාසන්න ව පවතින්නාවූ ද, පැහැදිලි අභ්‍යන්තර සීමාවක් රහිත වූ ද කුඩාතර ප්‍රදේශයකි. රුහුණු පියසට සරසවියක් අවශ්‍ය යැ'යි වැටහී ගොස්, එම අදහස අනුව යම් පියවර ගැනෙමින් පැවතුණු සමය තුළ මෙම කුඩා පියසින් බැහැරට කවරකු ගේ හෝ අවධානය ඒ පිළිබඳ ව යොමු වූයේ නැත. රුහුණේ සරසවිය ශ්‍රී ලංකාවෙ දකුණු ප්‍රදේශයෙහි ම මුහුදු තෙරින් නුදුරු ස්ථානයක පිහිටුවීම සුදුසු යැ'යි තහවුරු හැඟීමක් පොදුවේ පැවැත්තේ ය.

අවසනට තෝරා ගැනුණේ එම වෙරළ තීරයේ හරි මැද සේ පිහිටි මාතර යි. උසස් අධ්‍යාපන ආයතනවලින් බහු සංඛ්‍යාවක් පවතින අගනුවරින් හා ඒ අවට පියසින් ප්‍රමාණවත් සේ ඈත් ව ද , මංමාවත් වඩා අඩු වූත්, දේශගුණය මඳක් කර්කශ වූත් ගිනිකොන් ප්‍රදේශයෙන් බැහැර ව ද එය පිහිටියේ ය. තවද, සරසවියක් හා ගැළපෙන සාංස්කෘතික උරුමයක් ද මාතර සතු ය: එ නම්, මෙයට සියවස් දෙකකට පමණ පෙර බිහි වී වත්මන කරා නො සිඳී විහිදුණු බුද්ධිමය හා ශාස්ත්‍රීය සම්ප්‍රදයකි.

මේ අනුව පීඨ දෙකක් ද, පාලන අංශය ද ඉතා නුදුරු අනාගතයේ දී පිහිටුවනු ලබන ප්‍රධාන සරසවි උයන මාතර නගර සීමාවට තදාසන්න ව පිහිටියේ ය. පැරණි නාවිකයන් හා සිතියම්කරුවන් විසින් 'තෙනවරේ', 'ඩොන්ඩ්‍රුරේ', 'ඩොන්ඩ්‍රා' ආදී නම්වලින් හඳුන්වනු ලැබුවා වූ ද, නිල් මහනෙල් පැහැ ගත් සිරුරකින් යුත් උප්පලවණ්ණ හෙවත් උපුල්වන් දෙවිඳුන් නමින් ඉදි කැරුණු මහ දෙවොලක් කරණ කොට ගෙන පාරිශුද්ධියට පත් වුණා වූ ද දෙවිනුවර තුඩුව එයින් පෙනෙන මානයේ වෙයි. දෙණියාය කඳුවැටි පසුබිම් සේ ගෙන නැඟී සිටින එහි ගොඩනැගිලිවල උස් සඳලුතල ද, මුහුදු රළ හා ගැටෙන වෙරළබඩ දුඹුරු කඳුගැට ද මත සිටියකුට දිස් වන්නේ ඈත දකුණින් ඇන්ටාක්ටිකාවේ හිමදඹ සීමා කොට ගෙන විහිදෙන (නිල් මහනෙල් පැහැගත්) පුළුල් ඉන්දියානු සයුරේ සැතපුම් ස්වල්පයක් ප්‍රමාණය පමණි.

★

ශ්‍රී ලංකාවෙ දකුණු පාර්ශ්වයෙහි විශ්වවිද්‍යාලයක් පිහිටුවීම පිළිබඳ ව සාමාන්‍ය අදහසක් කලක් සිට ම පැවැත්තේ නමුදු, එහි අවශ්‍යතාව ද බෙහෙවින් පිළිගෙන පැවැත්තේ නමුදු, ඒ පිළිබඳ නිල පියවරක් ගැනුණේ 1977 ඔක්තෝබරයේ දී ය. මුදල් සහ ක්‍රම සම්පාදනය පිළිබඳ ගරු අමාත්‍ය තනතුරත්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දෙවිනුවර අසුනත් හෙබැවූ රොනී ද මෙල් මැතිතුමන් ගේ ඉමහත් උනන්දුව හා ධෛර්‍යය හේතු කොට ගෙන ය, ඒ. කොළඹ සහ පේරාදෙණියේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයවල සේවාවෙන්

ඉක්බිති ව, කොළඹ විශ්වවිද්‍යාලයේ සේවාවෙහි යෙදී සිටි ඉතා ප්‍රවීණ සහ ජ්‍යෙෂ්ඨ ආචාර්ය වරයකු වූ මහාචාර්ය ඇම්. බී. ආරියපාල මහතාණෝ, ගරු අධ්‍යාපන අමාත්‍ය නිශ්ශංක විජේරත්න මහතාණන් විසින්, මෙම නව උසස් අධ්‍යාපන ආයතනය පිහිටුවීම සඳහා සුදුසු ස්ථානය සහ එයට අයත් විය යුතු පීඨ පිළිබඳ සොයා බලා නිර්දේශ කිරීමේ බලතල ලත් කමිටුවක ප්‍රධානයා වශයෙන් ඉක්බිති ව පත් කරන ලදහ. මාසෑස්වල්පයක් ඇවෑමෙන්, 1978 ජනවාරි 4 වැනි ද, එම කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලදි. එහි නිර්දේශ වූයේ සියලු පීඨ කේන්ද්‍රගත නොවූණු ආයතනයක මධ්‍යස්ථානය මාතර විය යුතු බවත්· ආරම්භයේ දී එහි පීඨ හතරක් පැවතිය යුතු බවත්, ඒ අතරින් ශාස්ත්‍ර සහ විද්‍යා පීඨ මාතර ම ද, කෘෂිකර්ම විද්‍යා පීඨය සැතපුම් හයක් උතුරින් පිහිටි මාපලානේ රජයේ ගොවිපළේ ද, වෛද්‍ය පීඨය දකුණේ විශාලතම රෝහල පිහිටි ගාල්ලේ ද පිහිටුවිය යුතු බවත්, ඉංජිනේරු පීඨයක් පසු ව පිහිටුවිය යුතු බවත් ය. ඉක්බිති ව, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ උප-කුලපති මහාචාර්ය පී. පී. ජී. එල්. සිරිවර්ධන මහතාණෝ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මණ්ඩපයේ ඉතිහාස අධ්‍යයනාංශ ප්‍රධාන මහාචාර්ය සිරිමල් රණවැල්ල මහතාණන් මෙම ආයතනය පිහිටුවීමේ කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ නිලධාරියා වශයෙන් පත් කළහ. එම වසරේ මැයි මාසයේ දී මාතර එළියකන්දේ කාර්යාලයක් ද පිහිටුවන ලදි.

තවත් මාස කිහිපයකින්, 1978 අගෝස්තු 27 වැනි ද, ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු ජේ. ආර්:—ජයවර්ධන මහතාණෝ කෙටි එහෙත් උත්කර්ෂයෙන් යුත් උත්සවයකින් 'ශ්‍රී ලංකා විශ්ව—විද්‍යාලයේ මාතර මණ්ඩපය' විවෘත කළහ. එහි අධිපති වූවෝ මහාචාර්ය මර්වින් තේනබද්ද මහත්මෝ ය.

මේ අතරතුරෙහි දී, දිවයිනෙහි සම්පූර්ණ විශ්වවිද්‍යාලයීය ව්‍යුහය ප්‍රතිසංස්කරණයට පත් කිරීමේ අරමුණින් නව පණතක් පිළියෙළ වෙමින් පැවතිණි. 1978 16 වැනි විශ්ව විද්‍යාලයීය පණත යනුවෙන් අනුමත වුණු මෙයින් ඉටු වුණු ප්‍රධාන ප්‍රතිසංස්කරණය වනාහි දිවයිනෙහි පැවතුණු විශ්වවිද්‍යාලයීය මණ්ඩප පූර්ණ බලතල සහිත ස්වාධීන විශ්වවිද්‍යාලය බවට පත් වීම යි.

එහෙත්, මාතර පිහිටුවනු ලැබූ නව ආයතනය එම තත්ත්වයට එක් වර නැංවීමේ ලා සුදුසුකම් එද නොදරුවෙන් එය 1979 ජනවාරි 1 වැනි ද සිට 'රුහුණු විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය' යනුවෙන් නම් කොට තත්වයෙන් මඳක් ඔසොවන ලදි. එහි අධ්‍යක්ෂ තනතුරට පත් වූවෝ මහාචාර්ය ජී. සී. එන්. ජයසූරිය මහත්මෝ යි. එහි ශාස්ත්‍ර සහ වෛද්‍ය පීඨ කොළඹ විශ්වවිද්‍යාලයට ද, විද්‍යා පීඨය කැලණිය විශ්වවිද්‍යාලයට ද, කෘෂිකර්ම විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ද අනුයුක්ත කරන ලදි. ඒ අනුව පාඨමාලා සම්පාදනය සහ උපාධි සහතික පත් ප්‍රදානය ඒ ඒ විශ්වවිද්‍යාලයවලට පැවරිණි. අභ්‍යන්තර පාලනය පාලක මණ්ඩලයක් සතු විය.

මහාචාර්ය ජයසූරියයන් සිය තනතුරෙහි රැඳුණේ මසක් පමණි. ඉක්බිති ව, ඒ තැනට පත් වූවෝ කැලණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ සේවා කළ ආචාර්ය ඩී. ජ්. කොතලාවල මහතාණෝ ය. මෙම ආයතනයේ දියුණුව අරමුණු සේ ගෙන පස් වසර කලක් පුරා ඉමහත් උනන්දුවෙන් ද කැපවීමෙන් ද යුක්ත ව සේවාවෙහි යෙදුණු එ තුමෝ සප්තවාර්ෂික නිවාඩුව ලබා 1982 අගෝස්තු 10 වැනි ද නික්ම ගියහ. එම සේවා කාලය තුළ දී ආචාර්ය මණ්ඩලයේ වැදගත් තනතුරු සංඛ්‍යාවකට ම සුදුස්සෝ පත් කැරුණාහ, නව ගොඩනැඟිලි පිළිබඳ කටයුතු ආරම්භ විය, ආයතනයේ ලාඤ්ඡනය සැලසුම් විය, උද්‍යෝග පාඨය සහ වර්ණ පිළිගන්නා ලදි. ශාස්ත්‍රවේදී සහ විද්‍යාවේදී උපාධි පරීක්ෂණ ප්‍රථම වරට පවත්වන ලද්දේ ද 1981 දී ය.

රසායන විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධාන මහාචාර්ය ආර්.එච්. විජේනායක මහතාණන් මෙම ආයතනයේ අධිපති බවට ඉන්පසු ව පත් වූණේ ද, ඔවුන් එහි රැඳී සිටියේ දෙමස් කලක් පමණි. ඉක්බිති ව, එ තනතුරට පත් වූයේ ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධාන මහාචාර්ය ජී. පී. සමරවික්‍රම මහත්මෝ ය. වෛද්‍ය උපාධි පරීක්ෂණය සහ කෘෂිකර්ම විද්‍යා උපාධි පරීක්ෂණය ප්‍රථම වරට පවත්වන ලද්දේ ඉක්බිති ව ය.

මේ අතරතුරෙහි දී මෙම ආයතනය පූර්ණ බලතල සහිත ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට නැංවීමේ ලා කටයුතු පිළියෙළ වෙමින් පැවතිණි. මේ වන විට අධ්‍යයන කාර්‍ය පිළිබඳ සියලු පීඨවල ශක්තිය අවබෝධ ව පැවැත්තේ ය; පුස්තකාලය දියුණු වෙමින් ද, නව ගොඩනැගිලි පිළිබඳ කටයුතු රිසි වේගයෙන් ඉටු වෙමින් ද පැවතිණි. ප්‍රමාදයට විශේෂ හේතුවක් වූයේ නැත. මේ අනුව, 1984 පෙබරවාරි 1 වැනි ද රුහුණ විශ්වවිද්‍යාලය නිල වශයෙන් ආරම්භ විණි. එහි උපකුලපති තනතුර හොබවන්නට වූයේ මහාචාර්ය ජී. පී. සමරවික්‍රම මහතාණෝ ය. ලේඛකාධිකාරි තනතුරට බී. අබේසුන්දර මහත්මෝ ද, මූල්‍යාධිකාරි තනතුරට ඩබ්ලිව්. ඒ. එස්. වීරසිංහ මහත්මෝ ද පත් කරන ලදහ.

මෙම මසෙහි ම 10 සහ 11 වැනි දින තුළ මේ නව උසස් තත්ත්වය ලැබීම නිමිත්තෙන් ආයතනයෙහි උත්සව පැවැත්විණි. ශිෂ්‍ය සමූහයා ද සහභාගි වූණු විද්වත් පෙරහැරක් එළියකන්ද මංසන්ධියෙන් පිටත් ව මැද්දවත්තේ කාර්‍යාලය ගොඩනැගිල්ල ඉදිරිපිට පිහිටි අංගනය වෙත ළඟා වූණු පසු, එහි පැවැත්වූණු මහජන රැස්වීම අමතා ලේඛකාධිකාරිහු මෙම ආයතනයට විශ්වවිද්‍යාලයීය තත්ත්වය පැවරීමේ ප්‍රකාශනය ඉදිරිපත් කළහ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වූත්, විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිසම් සභාපති වූත් ආචාර්ය ස්ටැන්ලි කල්පගේ මහත්මෝ, මුදල් සහ ක්‍රම සම්පාදනය පිළිබඳ ගරු ඇමති රොනී ද මෙල් මහත්මෝ සහ උපකුලපති තුමෝ රැස්වීම ඇමතූහ. ඉක්බිති ව, රෑ තුන් යම පුරා පරිත්‍රාණ ධර්ම දේශනයක් පැවැත්විණ. පසු ද දිවායෙහි සියක් නමක් මහ සඟුන් වෙත දන් පිළිගැන්විණි. කාර්‍යාලයේ නිලධාරි සහ සේවක පිරිස මෙම ආගමික වැඩ කටයුතු පිළිබඳ ව බෙහෙවින් වගකීම් දැරූහ.

1984 මාර්තුවෙහි දී ගෞරවාර්හ පණ්ඩිත ශාස්ත්‍රවේදී සාහිත්‍යසූරි පරවාහැර පඤ්ඤානන්ද මා හිමියන් වහන්සේ රුහුණ විශ්වවිද්‍යාලයේ කුලපති තනතුරින් පුදන ලදහ.

★

විශ්වවිද්‍යාලයට අයත් සියලු අංශ මෙතෙක් ස්ථිර ගොඩනැගිලි කරා නොපැමිණියේ ය. 1978 සිට ම විද්‍යා පීඨය සහ කාර්‍යාලය මැද්දවත්තේ කනිෂ්ඨ කාර්මික විද්‍යාලයීය ගොඩනැගිලිවල ද, ශාස්ත්‍ර පීඨය එයට සැතපුම් භාගයක් ඈතින් පිහිටි එළියකන්දේ ගුරු අභ්‍යාස විද්‍යාලයීය ගොඩනැගිලිවල ද පැවැත්වෙයි. 1978 සහ 1979 දී මාතර විශ්ව-විද්‍යාලයීය මණ්ඩපය සඳහා තෝරා ගැනුණු වෛද්‍ය ශිෂ්‍යයෝ පේරාදෙණිය සහ කොළඹ විශ්වවිද්‍යාලයවලට අනුයුක්ත ව සිප් හැදෑරූහ. ඔවුන් ගාල්ලට පැමිණියේ මහමෝදර රෝහලෙහි වෛද්‍ය පීඨය 1980 දී ආරම්භ කළ පසු ය. 1978 දී තෝරා ගැනුණු කෘෂිකර්ම විද්‍යා ශිෂ්‍යයෝ ද ඉක්බිති වර්ෂයේ දී මාපලානට පිය නඟන තෙක් තාවකාලික ව රැඳුණේ මැද්දවත්තේ ය.

දැනට ක්‍රමයෙන් කෙළවර දකිමින් පවතින ගොඩනැගිලි කටයුතු ආරම්භ කරන ලද්දේ 1980 මැද භාගයේදී ගරු රොනී ද මෙල් අමාත්‍ය තුමාණන් හා ආචාර්ය කොතලාවල මහතාණන් විසිනි. කලා සහ විද්‍යා පීඨ ගොඩනැගිලි, පුස්තකාලය, කාර්‍යාලය, උප-කුලපති මැඳුර සහ ආචාර්ය-නිලධාරි පිරිස සඳහා ඉඩපහසුකම් ඉදි කිරීම සඳහා වැල්ල-මඩමේ අක්කර 71ක භූමි භාගයක් අත් කර ගන්නා ලදි. ක්‍රීඩා පිටියක් සහ විලක්

සඳහා ද මෙහි ඉඩ සලසනු ඇත. ගාල්ල පුරවරයෙහි උතුරු මායිමේ පිහිටි කරාපිටියේ නව රෝහලට යාබද ව වෛද්‍ය පීඨ ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අක්කර 12ක් ද, මාපලානේ අක්කර 108කින් යුත් ගොවිපළට යාබද ව තවත් අක්කර 10ක් ද අත්පත් කර ගැනිණ.

මෙම මූලික ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳ කටයුතු මාපලානේ 1983 අවසන්හි දී ද, කරාපිටියේ 1984 ජනවාරියෙහි දී ද කෙළවර දිටි. වැල්ලමඩමේ විද්‍යා පීඨ ගොඩනැගිලි, උපකුලපති මැඳුර සහ ආචාර්ය-නිලධාරි නිවාස 1984 සැප්තැම්බරයේ දී කෙළවර විය. සෙසු ඉදිකිරීම් කටයුතු සතුටුදායක වේගයෙන් ඉටුවෙමින් පවතී.

✶

රුහුණ විශ්වවිද්‍යාලයීය විද්‍යායතන ලාඤ්ඡනයෙහි පැරණි රුහුණු දනව්වේ සීමාව සහිත ශ්‍රී ලංකා දිවයින ද, එයට යටින් මැටි පහනක් ද නිරූපණය විය. පහනේ සිළුව සේ දක්වුණේ රුහුණු පියස ම ය. මේ ඇතුළු කොට, තිරස් දෙ පැති ඍජු රේඛා වශයෙන් පවතින සිහින් ඕවාල වට දෙකක් විය. එයට පිටතින් ඉහළ පාර්ශ්වයෙහි 'පඤ්ඤා නරානං රතනං' යන උද්‍යෝගපාඨය ද, පහළින් 'රුහුණ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය' යන්න ද සිංහල අකුරින් දැක්විණ. වඩා ගනකමින් යුත් තවත් ඕවාල හැඩයක් ඒ සියල්ල වටා විය.

ආයතනය විශ්වවිද්‍යාලය තත්ත්වයට නැංවුණු පසු මෙම ලාඤ්ඡනයෙහි ඇතැම් වෙනස්කම් කරන ලදි. රුහුණු දනව් සීමාව මැකිණි. පහන් සිළුව නැගෙන්නේ (ප්‍රධාන සරසවි උයන පවතින) ශ්‍රී ලංකා දකුණු වෙරළ තීරයේ හරි මැදින් සේ ය. සිළුවේ දීප්තිය, එයින් භාත්පසට විහිදෙන කෙටි ඍජු රේඛාව මඟින්, මුළු දිවයිනම ආලෝකවත් කරන්නා සෙයින් නිරූපිත ය. උචිත සේ පහළින් දැක්වෙන්නේ ''රුහුණ විශ්වවිද්‍යාලය'' යන්න ය.

රුහුණ විශ්වවිද්‍යාලයෙහි වර්ණ වනාහි රන්වන් සහ තද දුඹුරු පැහැ වෙයි. සාම්ප්‍රදායික සිංහල කලාවේ බෙහෙවින් දක්වෙන වර්ණයකි, රන්වන. පෙරදිග ලෝකයෙහි නුවණ සහ විද්වත් භාවය සංකේතවත් කරන්නේ ද එය යි. (බුද්ධිමය සහ චෛතසික උදාරත්වය පිළිබඳ ව බුහුමනට පත් භික්ෂූන් වහන්සේලා දරන්නේ ද එබඳු පැහැ ගත් චීවර යි.) ඒ අතර ම ආලෝකයේ සංකේතය ද එය යි. හිරු කැලුම් කවි සමයේ දැක්වෙන්නේ රන්වන් ලෙසිනි.

තද දුඹුරු වනාහි සරු පොළොවෙහි පැහැය ය. ඇතැම් විට එය ශක්තිය හා අධිෂ්ඨානයෙහි සංකේතයක් සේ ද පිළිගැනේ.

මෙම ආයතනයෙහි ධජය සම ප්‍රමාණයෙන් යුක්ත ව තිරස් ව විහිදෙන රන්වන් සහ තද දුඹුරු දෙ පටියකින් යුක්ත ය. රන්වන් පටිය ඉහළිනි; ඒ මත, කුඹයට ළං ව, තද දුඹුරින් සලකුණු කරන ලද ලාඤ්ඡනය වෙයි.

## *About Ourselves . . . .*

The historic principality of Ruhuṇa (Rōhaṇa in Skt. and Pali) occupied nearly half of the land-area of Sri Lanka to the south of the rivers Kaḷu and Mahaväli. It straddled the island from the S. W. coast to the Eastern, spreading over several natural regions so that a headland on the western shore-line, a lofty peak in the central mountain massif and a lagoon on the east coast sand-bars could claim a location in common. But in the crucible of Time the word, while managing to retain its form, could not help losing part of its meaning, and the effective Ruhuṇa today does not connote the whole of the sprawling territory as of old: it is but an undefined locality bordering the ocean on the South with its landward boundaries, if ever, vague and indeterminant. And when a University for the Ruhuṇa area was contemplated and the idea acted upon, hardly was any attention focussed to a location outside this region, however underfined its extent and limits were. The Ruhuṇa University, it was thought, should be sited somewhere in the South, and not far inland either.

The choice fell on Mātara, located somewhat in the center of the island's southern sea-board, not too close to the capital city in and around which many of the institutions of higher education are, and not unduely to the east where communication facilities are less and the climate not as congenial. Further, Mātara is blessed with a fitting heritage too: an intellectual tradition that burgeoned over two centuries ago to continue up to and merge with the literary and other learned activities of the present day.

So the main Campus which is soon to accommodate two of the Faculties and the administrative center is located just outside the town limits of Mātara within sight of Sri Lanka's southernmost point Tenavare, Dondure, Dondra or Dondra Head to sailors and map-makers of the past, but to us Devundara or Devinuvara, the 'City of God', hallowed by the fane of Uppalavaṇṇa or Upulvan of the 'colour of the blue lotus'. And from its southern-most mounds of brown earth hard by the waves and the highest balconies rising against the backdrop of the Deṇiyāya Hills one may espy but a few miles of an ocean surface (itself of the colour of the blue lotus) that stretches for well nigh a quarter of the earth's circumference right up to the very icy cliffs of Antarctica.

*

Although the general idea of setting up a University of Ruhuṇa 'somewhere in the South' had, for quite some time, been discussed at various levels and the necessity of setting up such an institution was widely accepted in

the country, it received official status only in October 1977, consequent to the keen interest and painstaking attempts made by the Hon. Ronnie de Mel, Minister of Finance and Planning and M. P. for Devinuvara. Prof. M. B. Ariyapala, a very senior academic who had served at the University of Ceylon, Colombo and Peradeniya, and was then attached to the University of Colombo, was appointed by the Hon. Nissanka Wijeratna, Minister of Education, to head a Committee empowered to recommend a suitable site for the location of the new institution and the Faculties of which it may be composed. Within a few months, on the 4th January 1978, the Committee submitted its report recommending Mātara as the most suitable center of a dispersed institution. The Committee was also of the opinion that it should possess four Faculties to begin with, viz., Arts and Science at Mātara itself, Agriculture at the Government Farm site at Māpalāna six miles to the north, and Medicine at Galle where the South's largest hospital is located. A Faculty of Engineering may be added at a later date. Subsequently, the Vice-Chancellor of the University of Sri Lanka, Prof. P. P. G. L. Siriwardana, appointed Prof. Sirimal Ranawella, Head of the Department of History of the Vidyālankāra Campus of the University of Sri Lanka, as the Officer Co-ordinating activities connected with the setting up of the new institution; and an initial administrative center was set up at Eḷiyakanda in May of the same year.

Not much time was lost, and on the 27th August 1978, the Hon. J. R. Jayewardene, Prime Minister of Sri Lanka, declared open at Mātara, by a simple though impressive ceremony, the 'Mātara Campus of the University of Sri Lanka' with Prof. Mervyn W. Thenabadu as its head.

A new University Bill aimed at bringing reform to the whole of the island's University set-up was, in the meantime, being drafted. It was passed in Parliament as the University Act No. 16 of 1978. An important reform brought about by this piece of legislation was the elevation of all Campuses of the former University of Sri Lanka to the status of independent and autonomous Universities.

The fledgling institution at Mātara was yet too young to be granted that status immediately. Nevertheless, it was elevated and renamed the 'Ruhuṇa University College' as from the 1st January 1979 with Prof. G. C. N. Jayasuriya as its Director. Its Faculties were affiliated as follows: Arts and Medicine to the University of Colombo, Science to the University of Kälaṇiya, and Agriculture to the University of Pērādeṇiya. Each University was granted the right to frame syllabuses and issue certificates to graduates of the Faculty assigned. Internal administration was vested in a Board of Management.

However, Prof. Jayasuriya left his post in about a month, and Dr. D. A. Kotalawala of the Kälaṇiya University was appointed to fill the vacancy.

Dr. Kotalawala served the infant institution with a deep sense of devotion and dedication for five years. During his tenure of office several key posts on the academic staff were filled, the building programmes inaugurated and the crest of the institution designed and adopted along with the motto and the official colours. The first set of graduates in Arts and Science passed out in 1981. Dr. Kotalawala left on the 10th August 1982 preparatory to his sabbatical leave.

Prof. R. H. Wijenayaka, Head of the Department of Chemistry, took over the reins of the institution but relinquished them after two months, and Prof. G. P. Samarawickrama, Head of the Department of Community Medicine, succeeded him. Soon the first batch of graduates from the Faculties of Medicine and Agriculture passed out.

Preparations were made, in the meanwhile, to elevate the institution to the status of an autonomous and independent University. All Faculties had demonstrated their academic efficiency, the library was expanding, the new buildings were being constructed at a satisfactory speed and there was no particular reason for delay. And so, on the 1st February 1984. the University of Ruhuṇa was formally inaugurated with Prof. G. P. Samarawickrama as its first Vice-Chancellor. Mr. B. Abeysundara and Mr. W. A. S Weerasinghe were appointed to the posts of Registrar and Bursar, respectively.

On the 10th and the 11th of the same month ceremonial activities to mark the occasion were held. An academic procession (in which the students too took part) started off from the Eḷiyakanda junction and reached the compound of the administrative building at Mäddavatta where the University community along with the members of the Mahā Saṅgha and a large number of distinguished invitees gathered for the inaugural meeting. Mr. B. Abeysundara, Registrar, read out the proclamation inaugurating the University of Ruhuṇa. Dr. Stanley Kalpage, Secretary to the Ministry of Higher Education and Chairman of the University Grants Commission, the Hon. Ronnie de Mel, Minister of Finance and Planning and the Vice-Chancellor addressed the gathering. A full night's chanting of Pirit was held in a picturesque *maṇḍapa*, and on the following day alms were served to 100 members of the Mahā Saṅgha. The members of the administrative staff were responsible to a large extent for the successful working of the religious programme.

The Ven. Pandit Paravāhära Paññānanda, B.A. (London), Hony. D. Litt. (Sri J'pura) was appointed Chancellor of the new University in March 1984.

Even up to the time of writing the University had not settled itself fully in permanent quarters. Right from 1978 the Faculty of Science and the administrative section are housed in the buildings of the former Junior Technical School at Mäddavatta, and the Faculty of Arts is accommodated within the Teachers' Training College at Eḷiyakanda, half a mile away by

the sea. Medical students selected for the Mātara Campus in 1978 and 1979 were accommodated in the Faculties at Pērādeṇiya and Colombo, and they moved in only after the Faculty of Medicine was set up at the General Hospital at Mahamōdara, Galle in 1980. The first set of students selected for the course in Agriculture (1978) were accommodated temporarily at Mäddavatta and were shifted to Māpalāna an year later.

The building programme now nearing completion was inaugurated in the middle of 1980 by the Hon. Ronnie de Mel and Dr. Kotalawala. An extensive site of 71 acres was acquired at Vällamaḍama for the construction of the buildings of the Arts and Science Faculties, the Library and the Administrative Center together with the Vice-Chancellor's Residence and limited residential facilities for the staff. Land for a play-ground and a lake has also been set apart here. A 12 acre extent adjacent to the new hospital at Karāpiṭiya on the northern skirts of the city of Galle was acquired for the construction of the buildings of the Medical Faculty. At Māpalāna a further extent of 10 acres bordering the original farm of 108 acres was acquired.

The initial building programme at Māpalāna was completed by the end of 1983, and at Karāpiṭiya by January 1984. The Science Faculty buildings, the Vice-Chancellor's Residence and staff quarters at Vällamaḍama were completed by September 1984, and the work on the rest is proceeding satisfactorily.

*

The crest of the institution, as initially designed, consisted of an outline of Sri Lanka in which was marked the boundary of the Rōhaṇa principality; below was a simple traditional earthenware lamp (*pahana*) the flame of which was shaped to occupy the total area of the principality. These were circumscribed by two concentric ovals with their vertical sides straight, exterior to which, on the upper half, ran the motto *paññā narānaṃ ratanaṃ* ('Wisdom to mankind is a treasure'), and on the lower half, the inscription *ruhuṇa viśva vidyālayīya vidyāyatanaya* ('Ruhuṇa University College'), both in Sinhala characters. Another similar oval, but in bolder line, ran round the lettering enclosing the whole design.

It has now been modified: the boundary of the principality is not shown in the outline of Sri Lanka, the flame of the *pahana* rises from near the center of the southern coastline (where the main campus is located) and its effulgence, represented by short, straight, radiating lines, appears to light up the whole island. The lower inscription has been appropriately changed to *ruhuṇa viśva vidyālaya* ('University of Ruhuṇa').

The official colours of the Ruhuṇa University are gold and chocolate brown. Of these, gold (with other similar pigments) has been evident in native Sinhala art for centuries. It also represents learning and wisdom in the Orient - with the monks (known for their intellectual and spiritual attainments) donning the robe of a kindred hue. Besides, it symbolises light — the rays of the sun being poetically imagined as *ranvan*, 'golden'.

Brown is the colour of the fecund earth and is, at times, regarded as symbolic of strength and resolution.

The flag of the institution is composed of two equal and horizontally disposed stripes in gold and chocolate brown, with the former on top. On the mastward top quarter (i.e., on the background of gold) is the crest, also in chocolate brown.